ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1782/27 - 2012 ඔක්තෝබර් 31 වැනි බදාදා - 2012.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට ගාල්ල ජල සම්පාදන ක්‍රමය යටතේ ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 26 වැනි දින,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය,
අංක 35, ලක්දිය මැඳුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.
5/2/2/982.

### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 96 සී කළුවැල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කළුවැල්ල ගමේ පිහිටි කළුවැල්ල ශ්‍රී වර්ධනාරාම විහාරස්ථාන ඉඩම නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ගල්කැටිය වත්ත ; |
| *නැගෙනහිරට* | : | ගල්කැටිය වත්ත හා පන්සල් ඉඩම ; |
| *දකුණට* | : | ගල්කැටිය වත්ත, ඇලබොඩ ගල්කැටිය වත්ත හා පන්සල් ඉඩම ; |
| *බටහිරට* | : | ශ්‍රී බුද්ධසිංහ පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. විහාරාධිපති,
ශ්‍රී වර්ධනාරාමය,
කළුවැල්ල,
ගාල්ල.

11-648

1A - G 16840 — 345 (2012/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.